සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2014

# ශිල්පකලා - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

01. අගය දක්වා නැති දෙන ලද කෝණයක් පිටපත් කිරීම සඳහා අත්‍යවශ්‍ය උපකරණ වන්නේ,
(1) කවකටුව හා සරල දාරය (2) බෙදුම්කටුව හා සරල දාරය
(3) කෝණමානය හා කවකටුව (4) කවකටුව හා බෙදුම්කටුව

02. පියන සහිත කාඩ්බෝඩ් පෙට්ටියක පෘෂ්ඨ සියල්ලම එක් තලයකට දිගහැරිය විට පෙනෙන ජ්‍යාමිතික රූපය හැඳින්වෙන්නේ,
(1) ත්‍රිමාන රූපය යනුවෙනි. (2) සැලැස්ම යනුවෙනි.
(3) විකසනය යනුවෙනි. (4) තල රූපය යනුවෙනි.

03. කඩදාසි වර්ගීකරණය අනුව පුල්ස්කැප් කඩදාසියක ප්‍රමාණය දැක්වෙනුයේ,
(1) $A_5$ ලෙසය. (2) $A_4$ ලෙසය. (3) $A_3$ ලෙසය. (4) $A_2$ ලෙසය.

04. කේන්ද්‍රික ඛණ්ඩයක හැඩයක් ගන්නා සුභපැතුම් පතක් නිර්මාණය කිරීම සඳහා ඔබ විසින් එම වෘත්තයෙන් ප්‍රයෝජනයට ගත යුත්තේ,
(1) කේන්ද්‍රය, ජ්‍යාය හා චාපය. (2) අරය, චාපය හා ජ්‍යාය.
(3) කේන්ද්‍රය, අරය හා පරිධිය. (4) කේන්ද්‍රය, චාපය හා අරය.

05. වෘත්තයක් සමාන කොටස් 04 කට බෙදූ විට ඉන් එක් කොටසක් හඳුන්වන්නේ,
(1) වෘත්ත පාදය නමිනි. (2) කේන්ද්‍රික ඛණ්ඩය නමිනි.
(3) අඩ වෘත්තය නමිනි. (4) පරිවෘත්තය නමිනි.

06. සරල රේඛා දෙකක ශීර්ෂ එකිනෙක හමුවීමෙන් සෑදෙන කෝණවල අගය අනුව ඒවා වර්ග කිරීම සිදු වේ. මෙහිදී $90^0$ වැඩි හා $180^0$ අඩු අගයන් ගන්නා කෝණය කුමන නමකින් හඳුන්වයි ද?
(1) සෘජු කෝණය. (2) මහා කෝණය. (3) සුළු කෝණය. (4) පරාවර්ත කෝණය.

07. පහත රූපයේ දැක්වෙන නිර්මාණය යොදා ගනු ලබන්නේ,
(1) රොම්බසයක් නිර්මාණය කිරීමටය.
(2) දෙන ලද වෘත්තයකට ස්පර්ශකයක් ඇඳීමටය.
(3) පාදයක් දිග දී ඇති විට ඕනෑම පාද ගණනක් ඇති බහු අස්‍රයක් නිර්මාණය කිරීමටය.
(4) සෘජුකෝණික ත්‍රිකෝණයක් නිර්මාණය කිරීමටය.




08. මෙම රූපටහනින් දැක්වෙන්නේ පහන් ආවරණයක් සැකසීම සඳහා සකස් කළ විකසනයකි. සේයා කරන ලද කොටස වෘත්තයෙන් ඉවත් කර ඇත. එම කොටස හඳුන්වන ජ්‍යාමිතික හැඩතලය කුමක් ද?
(1) අර්ධ වෘත්තය (2) කේන්ද්‍රික ඛණ්ඩය
(3) වෘත්ත ඛණ්ඩය (4) ඒක කේන්ද්‍රික වෘත්තය



09. කිසියම් ජ්‍යාමිතික වස්තුවක රූපීය පෙනුම එක් තලයකට දිගහැර ඇඳීම ''විකසනය'' නම් වේ. පහත රූපයෙන් දැක්වෙන්නේ,



(1) කේතුවක විකසනයකි.
(2) සිලින්ඩරයක විකසනයකි.
(3) චතුරස්‍ර ප්‍රිස්මයක විකසනයකි.
(4) ඝනකයක විකසනයකි.

10. පාසල් විවිධ ප්‍රසංගය පිළිබඳ ප්‍රචාරණයට බැනර් කීපයක් නිර්මාණය කර ගැනීම සඳහා වඩාත් සුදුසු පිළි අලංකරණ ක්‍රමයක් වන්නේ,
(1) අච්චු මුද්‍රණය (2) එම්බෝස් ක්‍රමය (3) තාප බන්ධිත ක්‍රමය (4) තිරරාමු මුද්‍රණය

11. කැබලි රෙදි කිසියම් රටාවකට ගොනුකොට මැසීමෙන් හා ඇලවීමෙන් කරන නිර්මාණ පැච්වර්ක් නිර්මාණ ලෙස හැඳින්වේ. මෙම ක්‍රමයට කුෂන් කවරයක් මැසීම සඳහා යොදා ගනු ලබන සම්මත දිග පළල වනුයේ,
(1) 18'' × 16'' (2) 16'' × 20'' (3) 16'' × 16'' (4) 18'' × 20''

12. විවිධ මාධ්‍ය වලින් සැකසූ ආභරණ අද වෙළඳපලේ දක්නට ඇත. 'සෙරමික් ක්ලේ' මින් එක් මාධ්‍යයකි. මේ සඳහා යොදා ගනු ලබන්නේ,
(1) පාන් පිටි (2) කෝන් පිටි (3) ප්ලාස්ටර් ඔෆ් පැරිස් (4) මැටි

13. විවාහ මංගල උත්සව වලදී මනාලියගේ මල්පොකුර සැකසීම සඳහා වඩාත් උචිත මල් වර්ග තෝරන්න,
(1) ගැටපිච්ච, කපුරු, රෝස, අරලිය. (2) වතුසුද්ද, සූරියකාන්ත, ඇන්තූරියම්.
(3) තාරකා, දහස්පෙතියා, බෝගන්විලා. (4) ඉද්ද, කානේෂන්, රැ කුමාරි.

14. රෙදි බෝනික්කා සෑදීමේදී භාවිතා කළ හැකි රෙදි වර්ගය කුමක් ද?
(1) නයිලෝන් රෙදි (2) ඇඳෙනසුළු රෙදි (3) කපු රෙදි (4) ලෝම රෙදි

15. පටපණුවාගෙන් ලබා ගන්නා කෙඳි ආශ්‍රයෙන් තනනු ලබන රෙදි වර්ගය වන්නේ,
(1) සේද (2) ලෝම (3) කෘත්‍රිම සේද (4) කපු

16. කපු කෙඳි වල ස්වභාවිකව ඇති ඉටි ආදිය හා බාහිරව එකතු වන වියලි පත්‍ර ඇට කැබලි ආදිය නිසාත් ඇතිවෙන අපිරිසිදු ද්‍රව්‍ය ඉවත් කිරීම හඳුන්වන්නේ,
(1) කැඳ හරණය (2) මලහරණය (3) විරංජනය (4) වර්ණ ගැන්වීම

17. ''ලාක්ෂා නම් කුඩා කෘමියෙකුගේ සිරුරින් නිකුත් වන ලාටු වැනි ද්‍රව්‍යයක් ඝනවූ පසු ලාක්ෂා ආලේපය නිෂ්පාදනය කෙරේ.'' ලාක්ෂා කෘමීන් යුෂ උරා බොන ශාක කාණ්ඩය වනුයේ,
(1) ග්ලිඩිසිරියා, කෝන්, කැප්පෙටියා. (2) තලකිරියා, ග්ලිඩිසිරියා, කැප්පෙටියා.
(3) කැප්පෙටියා, තලකිරියා, කෝන්. (4) කෝන්, තලකිරියා, ග්ලිඩිසිරියා.

18. හැදයක දිග මීටර් 50 කි. පළල සෙන්ටිමීටර් 20 කි. දික් සෙන්ටිමීටරයකට පොටවල් සංඛ්‍යාව 40 යි. හරස් සෙන්ටිමීටරයකට පොටවල් ගණන 36 යි. මෙම හැදයට අවශ්‍ය දික්නූල් පොටවල් ගණන සොයන්න.
(1) 50×20 = 1000 (2) 50×40 = 2000 (3) 40×36 = 1440 (4) 20×40 = 800

19. මෝස්තරයකට අනුව නූල් හැදයක් දික් ගසාගැනීම සඳහා දික්නූල් කුරු අසුරාගනු ලබන්නේ මින් කුමන උපකරණයේ ද?
(1) නූල් බෙත්ම (2) දික්නූල්කුරු රාක්කය
(3) දිග් ගසා ගැනීමේ ලෑල්ල (4) නූල් බෙරය

20. වර්තමානයේ තරුණ පරපුර බහුල වශයෙන් පරිහරණය කිරීමට කැමැත්තක් දක්වන ඩෙනිම් රෙදි වියනු ලබන්නේ කපු නූලෙනි. ඩෙනිම් රෙදි වියීමට භාවිතා රනු ලබන වියමන් රටාව කුමි ද?
(1) චාම් වියමන. (2) සරලහීරි වියමන. (3) ජටා වියමන. (4) සැටින් වියමන.

21. පහත සඳහන් වන්නේ කලිසම් රෙදි විවීම සඳහා බහුලව භාවිතා කෙරෙන වියමන් රටාවකි. එය කුමක් ද?

(1)



(2)



(3)



(4)



22. චාම් වියමන් ක්‍රමයේ ප්‍රභේදයක් වන ජටා වියමන හෙවත් මැට් වියමන පහත රටා අතුරෙන් තෝරන්න.

(1)



(2)



(3)



(4)



23. රෙදිපිළි අලංකරණයේ දී ස්ටිකරයක් ඇලවීමේ ක්‍රමයට සමාන චිත්‍ර ඇඳීමේ හැකියාව අඩු අයෙකුට වුවද වඩාත් පහසුවෙන් කළ හැකි අලංකරණ ක්‍රමය කුමක්ද?

(1) මැසීමේ ක්‍රමය (2) පින්තාරු ක්‍රමය (3) තාපබන්ධිත ක්‍රමය (4) එම්බෝස් ක්‍රමය

24. ඇස්බැස්ටෝස් කෙඳි වැනි ඛනිජ කෙඳි කාර්මික කටයුතු වලට අවශ්‍ය රෙදිපිළි නිෂ්පාදනය සඳහා විශේෂයෙන් භාවිත කෙරේ. එසේ කිරීමට හේතු මොනවා ද?

(1) පුස් නොබැඳීම හා දිරාපත් නොවීම. (2) අලංකාරයෙන් සහ වටිනාකමින් වැඩි වීම.

(3) මළ නොබැඳීම සහ බරින් වැඩි වීම. (4) තාපයට ඔරොත්තු දීම සහ ගිනි නොගැනීම.

25. රෙදි විවීම යනුවෙන් හැඳින්වෙන්නේ පහත සඳහන් කුමන ක්‍රියාවද?

(1) දික්නූල් හා හරස්නූල් අතර බැඳීම. (2) දික්නූල් බෙරයේ ඔතා ගැනීම.

(3) දික්නූල් නූල් කුරු වලට එතීම. (4) නූල් හැදයක් වටකඳට එතීම.

26. ස්වභාවික හේතූන් මත පාෂාණ දිරාපත් වීමෙන් නිර්මාණය වන මැටි නිධි වශයෙන් පොළවේ තැන්පත් වී ඇත. මෙම මැටි හඳුන්වන විද්‍යාත්මක නාමය කුමක් ද?

(1) සිලිකන්ඩයෝසයිඩ් (2) පෙල්ඩ්ස් පාර්

(3) ඇලුමිනා සිලිකේට් (4) ඇලුමිනියම් ඩයොක්සයිඩ්

27. පෝරණු වර්ග රාශියක් ඇත. වර්තමානයේ විවිධ නවීකරණයන්ට ලක් කර ගුණාත්මක බවින් ඉහල පෝරණු වර්ග නිපදවා ඇත. ඒ අතරින් උමං පෝරණු නමින් හැඳින්වෙන්නේ කුමන පෝරණුව ද?

(1) යටිදහර පෝරණුව (2) දෝනා පෝරණුව (3) ආවරක පෝරණුව (4) රෝලර් පෝරණුව

28. මාබල් ක්‍රමයට මැටි භාණ්ඩයක් අලංකාර කිරීමේදී ජලබඳුන මත ඉතා ප්‍රවේශමෙන් සායම් තැන්පත්කර ගැනේ. මේ සඳහා ගනු ලබන්නේ,

(1) තෙල් සායම් (2) දිය සායම් (3) පෝස්ටර් සායම් (4) රෙදි මුද්‍රණ සායම්

29. අච්චු තැනීමේදී අච්චු තැනීමට උපයෝගී කර ගන්නා භාණ්ඩ ආදර්ශ යනුවෙන් හැඳින්වේ. අච්චුව ආදර්ශයෙන් වෙන් කර ගැනීම සඳහා ආලේප කරන්නේ,

30. පාෂාණ ජීර්ණය වීමෙන් මැටි නිර්මාණය වේ. මැටි ජීර්ණය වූ ස්ථානයේම තැන්පත් වන මැටි හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) ද්විතියික මැටි (2) ප්‍රාථමික මැටි (3) බෝල මැටි (4) තලප මැටි

31. වෘත්තාකාර භාණ්ඩ තැනීම සඳහා 'ඉදිකිරීම' ක්‍රමය යොදා ගනී. මේ සඳහා යොදා ගන්නා උපකරණය,
(1) අච්චුව (2) සකපෝරුව (3) බඹර රෝදය (4) ආදර්ශය

32. මැටි භාණ්ඩ වල වූ මැටි අණු අතර විවර සහිත වීමෙන් ජලය උරා ගැනීමටත් පිට කිරීමටත් හැකියාව ඇත. මැටිවල පවත්නා මෙම ලක්ෂණ හඳුන්වන්නේ කෙසේ ද?
(1) සුවිකාර්යතාවය යනුවෙනි. (2) ඝනත්වය යනුවෙනි.
(3) සවිවරතාවය යනුවෙනි. (4) හැකිලීම යනුවෙනි.

33. කලාත්මක මැටි භාණ්ඩ, පිඟන් භාණ්ඩ, විසිතුරු භාණ්ඩ තැනීම සඳහා භාවිත කරනු ලබන්නේ ප්ලාස්ටර් ඔෆ් පැරිස් මාධ්‍යයෙන් සකස් කරන ලද අච්චුය. ප්ලාස්ටර් ඔෆ් පැරිස් සකස් කරනු ලබන්නේ කුමන ද්‍රව්‍යයකින් ද?
(1) සිලිකන් ඔක්සයිඩ් (2) ජිප්සම් (3) බෝල මැටි (4) දියලු මැටි

34. මැටි භාණ්ඩ නිපදවීම සඳහා ක්‍රම කීපයක් භාවිතා කෙරේ. මෙහිදී මැටි කර්මාන්තයේ විශිෂ්ඨතම නිෂ්පාදන ක්‍රමය ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) සකපෝරුව භාවිතය. (2) අච්චු ක්‍රමය.
(3) ඇඹීමේ ක්‍රමය. (4) දරණු ක්‍රමය.

35. එකම ප්‍රමාණයේ එකම හැඩයේ භාණ්ඩ රාශියක් නිෂ්පාදනයේ දී යොදා ගැනීමට වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
(1) අච්චු ක්‍රමයයි. (2) ඉදිකිරීමයි.
(3) තහඩු ක්‍රමයයි. (4) සකපෝරුව යොදා ගැනීමයි.

36. මැටි භාණ්ඩ අලංකරණය ප්‍රධාන අවස්ථා හතරක් යටතේ සිදු කළ හැකිය. පහත සඳහන් අලංකරණ ක්‍රම අතුරින් හම් පදම් අවස්ථාවේදී යෙදිය හැකි අලංකරණ ක්‍රමය වන්නේ,
(1) කැටයම් යෙදීම. (2) දිස්න යෙදීම. (3) සිත්තම් කිරීම. (4) සිදුරු කැපීම.

37. පදම් මැටි භාවිත කර සාදන මැටි භාණ්ඩ වේලීමෙන් පසු පිළිස්සීමට භාජනය කරනු ලැබේ. මැටි භාණ්ඩ පිළිස්සීමෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද?
(1) ශක්තිය ලබා ගැනීමයි. (2) භාවිතයේ පහසුවයි.
(3) අලංකාර කර ගැනීමයි. (4) වර්ණ ගැන්වීම සඳහායි.

38. මුද්‍රිත කඩදාසි වලින් කපා ගන්නා පින්තූර කොටස් ඇලවීමෙන් මැටි බඳුනකට අලංකරණය ලබා දෙන්නේ,
(1) කොලාජ් ක්‍රමයයි. (2) ඩෙකෝපාජ් ක්‍රමයයි.
(3) විල්ප ක්‍රමයයි. (4) මාබල් ක්‍රමයයි.

39. වෘත්තාකාර හැඩය සහිත බොහෝ භාණ්ඩ භාවිතයේ පවතී. ඒවා ඉතා සමබර ලෙස ගොඩ නඟා ගැනීමට මැටි ශිල්පීන් ආධාර කර ගනු ලබන්නේ සකපෝරුවය. සකපෝරුවෙන් ඉදිකිරීමේ ක්‍රියාවලියේ වැදගත්ම අංගය ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) මැටිපිඩ සකපෝරුවේ සවිකර ගැනීම.
(2) ක්‍රමවත්ව සකපෝරුව භ්‍රමණය කර ගැනීම.
(3) මැටිපිට මධ්‍යගත කර ගැනීම.
(4) විධිමත්ව භාණ්ඩය සකපෝරුවෙන් ඉවත් කර ගැනීම.

40. පොළවෙන් ලබා ගන්නා මැටි භාවිතයට සුදුසු ලෙස ක්‍රම දෙකට අනුව සකස් කෙරේ. එයින් එක් ක්‍රමයක් වන වියළි මැටි වශයෙන් සකස් කර ගැනීම සඳහා කුමන ක්‍රියාවලියක් භාවිත කරයිද?
(1) දියකර ගෝනියකින් පෙරා තහඩුවක අතුරා වියළා ගැනීම.
(2) වියළා අපද්‍රව්‍ය ඉවත් කර කුඩුකර සකස් කර ගැනීම.
(3) පොඟවා දියකර පෙරා වියළා සකස් කර ගැනීම.
(4) යන්ත්‍රයකින් අඹරා පෙරා වියළා සකස් කර ගැනීම.

*සියලුම හිමිකම් ඇවිරිණි.*
*All Rights Reserved*

# මධ්‍ය වාර පරීක්ෂණය 2014

# ශිල්පකලා - II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) පසුගිය දිනක සබරගමුව පළාත්සභාව මඟින් තරුණෝදය වැඩසටහන යටතේ ''රැකියා මංපෙත්'' නමින් තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා ලබා දීමේ අරමුණින් නිර්මාණ ප්‍රදර්ශනයක් කෑගල්ල ස්වර්ණජයන්ති මහා විද්‍යාලයේදී පවත්වන ලදී. විවිධ අත්කම් නිර්මාණ හා නව නිපැයුම්, කෘෂි හා ආහාර නිෂ්පාදන හා විවිධ විෂයයන් යටතේ රැකියා මංපෙත් විවර වන අධ්‍යාපනික හා සංස්කෘතික වටිනාකමකින් අංශ කීපයක් ඔස්සේ ප්‍රදර්ශනය පැවැත්විණි.

i. ශිල්පලා විෂයය හදාරණ ශිෂ්‍යයකු / ශිෂ්‍යාවක වශයෙන් ඔබට මෙම ප්‍රදර්ශණය සඳහා ඉදිරිපත් කිරීමට හැකි පරිසර හිතකාමී නිර්මාණ දෙකක් නම් කරන්න.

ii. මෙම ප්‍රදර්ශණය පිළිබඳ ප්‍රචාරක බැනරයක සැලසුමක් ඇඳ පෙන්වන්න.

iii. ප්‍රදර්ශණ කුටි හැඳින්වීම සඳහා යොදාගන්නා නාම පුවරුවක පසුබිම ගොක්කොළ හා පොල්කොළ භාවිත කරමින් සකසා ගැනීමට අදහස් කෙරේ. මේ සඳහා සුදුසු වියමන් රටාවක් නම් කර ඇඳ පෙන්වන්න.

iv. අමුත්තන් පිළිගැනීම සඳහා සුදුසු මල් මාලයක දල රූපසටහනක් ඇඳ දක්වන්න. (ස්වභාවික මල්)

v. උත්සව ශාලාව වේදිකාව දෙපස අලංකාර කරනලද මැටි බඳුන් තබා අලංකාර කර තිබුණි. ඒ සඳහා සුදුසු මැටි බඳුනක රූපසටහනක් චිත්‍රයට නඟන්න.

vi. උත්සවයේ ආරාධිත අමුත්තන් පිළිගැනීම සඳහා බාලිකා තූර්යවාද කණ්ඩායම් සහභාගී වූ අතර ඔවුන්ගේ ආභරණ සකසා තිබුණේ ''පාන් ක්ලේ'' මඟිනි. ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ මොනවා ද?

vii. උත්සව සංවිධායක කමිටුව සඳහා සුදුසු ලාංඡනයක් ජ්‍යාමිතික හැඩතල ඇසුරින් ඇඳ පෙන්වන්න.

viii. ඝන කඩදාසි ආධාරයෙන් සකස් කළ හැකි සමචතුරස්‍රාකාර ඇසුරුම් පෙට්ටියක රූපීය පෙනුම දළ සටහනකින් ඇඳ දක්වන්න.

ix. අමුත්තන් පිළිගැනීම සඳහා පැමිණි බාලිකා නැටුම් කණ්ඩායමේ ඇඳුම සඳහා පින්තාරු කිරීමට සුදුසු මෝස්තරයක් අඳින්න.

x. අමුත්තන් ලවා දැල්වීම සඳහා සාම්ප්‍රදායික පොල්තෙල් පහන වෙනුවට හය දෙනෙකුට දැල්විය හැකි නව නිර්මාණ පොල්තෙල් පහනක් සකසා තිබුණි. ඔබත් එවැනි පහනක දළ සැලැස්මක් ඇඳ දක්වන්න.

(ලකුණු 2×10=20)

(02) ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම මානවයා තම අවශ්‍යතා සඳහා මැටි භාණ්ඩ නිපදවා ඇති බව ඓතිහාසික මූලාශ්‍ර වලින් සනාථ වේ.

i. ප්‍රාථමික මැටි යන්න හඳුන්වන්න. (ල.02)

ii. මැටි භාණ්ඩ නිපදවීම සඳහා යොදා ගන්නා ක්‍රම 05 ක් නම් කරන්න. ඉන් එක් ක්‍රමයකට සාදන ලද මැටි බඳුනක රූපසටහනක් අඳින්න. (ල.05)

(03) මාතෘ පාෂාණය ජීර්ණය වීමෙන් මැටි නිර්මාණය වේ.

i. සංයුතිය අනුව මැටි වර්ග කරන්නේ කෙසේ ද? (ල.02)

ii. මැටිවල අඩංගු භෞතික සහ රසායනික ගුණ හතරක් නම් කරන්න. (ල.03)

iii. 'තෙත මැටි' වශයෙන් මැටි සකස් කර ගන්නා ආකාරය පියවර අනුව විස්තර කරන්න. (ල.05)

(04) එදිනෙදා ජීවිතයේදී ප්‍රීතිමත් අවස්ථා වලදී මෙන්ම කණගාටුදායක අවස්ථා වලදීද අලංකරණය සඳහා මල් භාවිත කෙරේ.

i. ස්වභාවික මල් කල්තබා ගත හැකි ක්‍රම දෙකක් නම් කරන්න. (ල.02)

ii. මල් සැකසුම් නිර්මාණයේ දී යොදා ගත හැකි විශේෂිත හැඩයන් හතරක් නම් කරන්න. (ල.03)

iii. මනාලියක් සඳහා රෝසමල් කළඹක් සකස් කර ගන්නා ආකාරය අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල.05)

(05) විවීමේ දී රෙදිපිළි අලංකරණය සඳහා විවීමේ රටා යොදා ගනී.

i. මූලික වියමන් රටා මොනවා ද? (ල.02)

ii. හීරි වියමන් ප්‍රභේද කීයද? ඒ මොනවා ද? (ල.03)

iii. ඔබ කැමති හීරි වියමන් රටාවක ඒකක දෙකක් ඇඳ දක්වන්න. (ල.05)

(06) පාසැල් නිල ඇඳුමේ කලිසම් රෙදි සඳහා සස් කරන ලද නූල් හැදයක දළ රූප සටහනක් පහත දැක්වේ.




The National e-Learning Portal for The General Education

| | |
|---|---|
| හැදයේ දිග | මීටර් 100 |
| හැදයේ පළල | සෙන්ටිමීටර 24 |
| සෙන්ටි මීටරයකට දික් නූල් ප්‍රමාණය | 40 |
| නූල් වර්ගය | 2 / 40$^s$ |
| නූල් වර්ණය | නිල් |

i. මෙම කලිසම් රෙදි වියා ගැනීමට සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න. (ල.02)

ii. නම් කරන ලද වියමන් රටා දෙකෙහි මතුපිට නූල් මතුවීම ප්‍රස්ථාර ගත කරන්න. (ල.03)

iii. හැදයට අවශ්‍ය 2/40$^s$ නිල් නූල් ප්‍රමාණය ගණනය කරන්න. (ල.05)